# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2376/14 - 2024 මාර්තු මස 19 වැනි අඟහරුවාදා - 2024.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමග කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 මාර්තු මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි "**2024 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**" ලෙස හඳුන්වනු ලැබේ.

2. වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2024 පෙබරවාරි මස 07 දිනැති අංක 24/0309/628/018 දරන සංදේශය පිළිබඳ 2024 පෙබරවාරි මස 26 දිනැති, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සමග එක්ව කියවනු ලබන එකී සංදේශය සඳහා ලද 2024 පෙබරවාරි මස 26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ.

3. මෙම *ගැසට් පත්‍රයේ* මින්මතු දක්වා ඇති අංක 3.1 සහ 3.2 දරන රෙගුලාසි, සංශෝධිත, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/78 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අනිවාර්ය අංගයන් ලෙස නිකුත් කෙරේ.

3.1 ඉහත සඳහන් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 4 දරන රෙගුලාසියෙහි කෙසේ සඳහන් වුව ද, පහත උපලේඛනයේ විස්තර කර ඇති භාණ්ඩ ආනයනය සඳහා, අදාළ විෂය භාර අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශය මත එච්. එස්. 87 පරිච්ඡේදය යටතේ වර්ගීකරණය කරන ලද මෝටර් වාහන ආනයනය කිරීමේදී අදාළ වන අනෙකුත් පවතින නීතිරීති සහ රෙගුලාසිවලට යටත්ව ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් අවසර ලබා දෙනු ලැබේ.

| *එච්. එස්. කේතය* | *විස්තරය* | *ඒකක ගණන* | *ආනයනකරු / භාණ්ඩ තොග ලබන්නා* |
|---|---|---|---|
| 8703.21.54 | අනෙකුත්, අවුරුදු 2කට වඩා නොපැරණි (ත්‍රීරෝද රථ පමණි) | 05 | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |
| 8704.22.61 | අවුරුදු 5කට වඩා නොපැරණි (ඉවතලන කසල හැකිළිය හැකි අපහරණ රථයක් පමණි) | 01 | ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම |
| 8704.21.91 | කුටිය සහ භාණ්ඩ ප්‍රදේශය සඳහා වෙන් වූ බඳවල් සහිත අවුරුදු 4කට වඩා නොපැරණි අනෙකුත් වාහන (ඩබල් කැබ් රථ පමණි) | 04 | අධ්‍යාපන අමාත්‍යාංශයේ PALAM/A ව්‍යාපෘතිය |
| 8703.40.71 | අවුරුදු 3කට වඩා නොපැරණි (ආසන 07 මෝටර් රථයක් පමණි) | 01 | CHEC කොළඹ වරාය නගරය (පුද්ගලික) සමාගම |

3.2 ඉහත සඳහන් කරන ලද 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 4 දරන රෙගුලාසියෙහි කෙසේ සඳහන් වුව ද, රජයේ ආයතන විසින්, පරිත්‍යාග වශයෙන් හෝ ව්‍යාපෘති ගිවිසුම්වල විධිවිධානවලට අනුව, ඍජු භාවිතය සඳහා පමණක් ආනයනය කරනු ලබන මෝටර් වාහන රේගු නිෂ්කාශනය සඳහා, ශ්‍රී ලංකා රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ පාලක ජනරාල්වරයාගේ අනුමැතිය මත අවසර ලබා දෙනු ලැබේ.

4. පසුව සංශෝධනය කරන ලද 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කෙරේ.

4.1 ඉහත සඳහන් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල අංක 9 දරන රෙගුලාසියෙහි කෙසේ සඳහන් වුව ද, රාජ්‍ය හෝ පෞද්ගලික රෝහල්වල ඍජු භාවිතය සඳහා එම රෙගුලාසිවල **V වන උපලේඛනයේ** ලැයිස්තුගත කර ඇති ගිලන්රථ "විදේශ විනිමය වැය නොවන" පදනම මත ආනයනය කිරීමට ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව ආනයන පාලන බලපත්‍ර නිකුත් කළ යුතුය.

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

6. ඉහත රෙගුලාසිවලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබා දෙනු ලැබේ.

EOG 03 - 0170

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.